සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය

# නාට්‍ය හා රංගකලාව - I

කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

**සැලකිය යුතුයි ඃ**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

---

- **පහත දැක්වෙන ගද්‍යපාඨ ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - මං මේ උදැල්ලෙම වැදිහිරයෙකුත් කරේ තියාගෙන නැන්දම්මගේ උයන පාළු කරපු.....

B - ''ඔබ ඉඩ දෙනවානම් මං මෙහි නවාතැන් ගන්නවා අද රාත්‍රියට''

C - මනුස්සානම් අත්ථී, මණ්ඩපං අත්ථී .........

D - ආච්චි අම්මා........., ආච්චි අම්මා හූච්චි අම්මා........

E - ඌට කකුල් පහක් තිබුණා. අපි දැක්කම ජබුක් ගාලා ගඟට පැන්නා

01. ඉහත ගද්‍ය සංවාද අතුරෙන් බෞද්ධ පූජාකර්මයකට අයත් වන්නේ,

(1) A (2) B (3) C (4) D

02. සංඛපාල රජු සම්බන්ධ ශාන්තිකර්මයකට අදාල ගද්‍ය සංවාද වන්නේ,

(1) D (2) C (3) E (4) A

03. මැණික්පාල ශාන්තිකර්මයට අදාල සංවාදය වන්නේ,

(1) E (2) B (3) C (4) D

04. පත්තිනි දෙවියන් හා සම්බන්ධ ශාන්තිකර්මය වනුයේ,

(1) B (2) A (3) E (4) D

05. උඩරට ශාන්තිකර්මයට අදාල සංවාදය වන්නේ,

(1) E (2) D (3) B (4) A

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. තම පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණය කරන චලන වන්නේ,

(1) නිර්මිත චලන (2) ස්වභාවික චලන
(3) තාලානුකූල චලන (4) අභිරූපන චලන

07. ''නාට්‍ය යනු ක්‍රියා අනුකරණය කිරීමකි''මෙය ප්‍රකාශ කළේ,

(1) ශේක්ෂ්පියර් (2) බර්නාඩ් ෂෝ (3) ඇරිස්ටෝටල් (4) භරතමුණි

08. රංග අභ්‍යාසයක් වන්නේ,

(1) වෙද පුටුව (2) මකර වල්ගය
(3) නායකයා සෙවීම (4) බල්ලා සහ මස්කට්ට

09. ක්ෂණික නිරූපනයක ලක්ෂණ වන්නේ,

(1) පිටපතක් සහිතව නිරූපනය කෙරේ. (2) පෙර සූදානමකින් නිරූපනය කෙරේ.

(3) දෙන ලද ඉගියකට අනුව නිරූපනය කෙරේ. (4) අවස්ථා කිහිපයක් නිරූපනය කෙරේ.

10. නෘත්‍යවලට අදාල වන්නේ,

(1) අංග වික්ෂේපයක් පමණි. (2) ලී කෙළි, කළගෙඩි, වෙස් නැටුම් උදාහරණ වේ.

(3) මෙය ශුද්ධ නැටුම නම් වේ. (4) ආංගිකාභිනය, සාත්විකාභිනය ප්‍රධාන වේ.

11. දෘෂ්‍ය කලාවලට අදාල වන්නේ,

(1) චිත්‍රපටය, සාහිත්‍ය, නවකතා, සංගීතය (2) චිත්‍ර, මූර්ති, කැටයම්, ප්‍රතිමා

(3) සංගීතය, මූර්ති, සාහිත්‍ය, ටෙලිනාට්‍ය (4) කැටයම්, ප්‍රතිමා, නාට්‍ය,සංගීතය

12. නාට්‍ය පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශනය වන්නේ,

(1) නළුවා මඟිනි (2) රංගාලෝකය මඟිනි

(3) අංගරචනය මඟිනි (4) රංගරචනය මඟිනි

13. නාට්‍යමය අවස්ථාවක් හා සම්බන්ධ වන්නේ,

(1) හුදු අවස්ථා නිරූපනයක් පමණක් වේ. (2) දෙපාර්ශවයේ ම එකඟතාවයන් දක්නට ලැබේ.

(3) ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලින් දෙකක් දක්නට ලැබේ. (4) සෑම අවස්ථාවකදී ම හාස්‍ය රසය ජනිත වේ.

14. ප්‍රසිද්ධ මුද්‍රා නාට්‍යයක් වන්නේ,

(1) හංසවිල (2) කරදිය (3) මානසවිල (4) දෙපානෝ

15. අංග රචනයේ සෑම විටම,

(1) නළුවාගේ මුහුණ අලංකරණය කිරීමට යොදා ගැනේ.

(2) සාත්වික අභිනය තීව්‍ර කිරීමට උපකාරි වේ.

(3) නළු පෞරුෂය ගොඩ නැගීමට උපකාරි වේ.

(4) චරිතයේ වයස හැඟවීමට යොදා ගැනේ.

16. නාට්‍යයකට අත්‍යවශ්‍යම අංග 3 වන්නේ,

(1) නාට්‍ය පෙළ, නළුවන් හා ප්‍රෙක්ෂකයින් (2) අධ්‍යක්ෂකවරයා, නාට්‍ය පෙළ, සංගීතය

(3) නාට්‍ය පෙළ, සංගීතය, ප්‍රේක්ෂකයින් (4) නාට්‍ය පෙළ, නළුවන්, අධ්‍යක්ෂකවරයා

17. රංග ක්‍රීඩාවල අරමුණ වන්නේ,

(1) ක්‍රීඩා කෞෂල්‍ය දියුණු කිරීම. (2) හඬ උච්ඡාරණය දියුණු කිරීම.

(3) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ඇති කිරීම. (4) පෙළ රචනය වර්ධනය කිරීම.

- **පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 18 - 22 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයාගේ නම | පරිවර්තනය | පරිවර්තකයා |
|---|---|---|---|
| වෙරිඹවර්ඩ් | A | වෙරි වත්ත | මැන්දිස් රෝහණධීර |
| B | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |
| කැට් ඔන් ද හොට්ටින් රූෆ් | ටෙනසි විලියම්ස් | හෙලේ නැග්ග ඩෝං පුතා | C |
| මර්චන්ට් ඔෆ් වෙනිස් | විලියම් ශේක්ස්පියර් | D | බන්ධුල විතානගේ |
| E | හෙන්රික් ඉබ්සන් | බෝනික්කි ගෙදර | සුනිල් විජේසිරිවර්ධන |

18. ඉහත වගුවේ A අක්ෂරය ඇතුළත් විය යුතු විදේශ නාට්‍යකරුවා වන්නේ,

(1) ඇන්ටන් චෙකෝෆ් (2) බර්නාර්ඩ් ෂෝ

(3) එමිල් සෝලා (4) හෙන්රික් ඉබ්සන්

19. ඉහත වගුවේ B අක්ෂරයට ඇතුළත් විය යුතු විදේශීය නාට්‍ය වන්නේ,

(1) ද පබ්ලික් එනිමි (2) කොකේෂියන් චෝක් සර්කල්

(3) ද ඩ්‍රැගන් (4) ද ත්‍රී පෙනි ඔපෙරා

20. ඉහත වගුවේ C අක්ෂරයට ඇතුළත් විය යුතු පරිවර්තකයා වන්නේ,

(1) හෙන්රි ජයසේන (2) ගුණසේන ගලප්පත්ති

(3) සුගතපාල ද සිල්වා (4) පියදාස නිශ්ශංක

21. ඉහත වගුවේ D අක්ෂරයට ඇතුළත් විය යුතු පරිවර්තක නාට්‍ය වන්නේ,

(1) මකරාක්ෂයා (2) හිරු නැති ලොව

(3) වැනීසියේ යාචකයා (4) වැනීසියේ වෙළෙන්දා

22. ඉහත වගුවේ E අක්ෂරයට ඇතුළත් විය යුතු විදේශීය නාට්‍ය වන්නේ,

(1) ද ඩෝල්ස් හවුස් (2) ද බෘගන්

(3) රුඩත්ස් (4) ද මැරේජ්

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

23. විකෘති නාට්‍යයේ ප්‍රියංගනීගේ දෙමව්පියන් වන්නේ,

(1) කරුණාරත්න හා හිල්ඩා (2) කරුණාරත්න හා සිල්වා

(3) ගුණසේන හා සිල්වා (4) කරුණාරත්න හා සුසිලා

24. පහත දැක්වෙනුයේ විකෘති නාට්‍යයේ එන චරිතයි,

(1) ජගත් ,සම්පත්, ස්වදේශ, මැටිල්ඩා (2) සම්පත්, ප්‍රියංගනී,ට්‍රික්සි,මැටිල්ඩා

(3) සම්පත්, ට්‍රික්සි, හිල්ඩා, ජගත් (4) සම්පත්, සුසිලා, හිල්ඩා, ජයපාල

25. ''මොකද අප්පේ අද විතරක් මේ දෙන්නට ලොකු කලබලයක්. මම ඉස්කෝලෙ ගියේ නෑ කියලා'' මෙම ප්‍රකාශය කරනු ලබන්නේ,

(1) ප්‍රියංගනී (2) සම්පත් (3) සරණපාල (4) ජගත්

.26. දික්තල කාලගෝල නාට්‍යයේ කාලගෝලගේ මව්පියන් වන්නේ,

(1) කයිදා හා චමරි (2) කිරිසන්දු හා දික් සුරඹී

(3) චූලදත්ත හා දික් සුරඹී (4) හේතුපානි හා චූලදත්තී

27. දික්තල කාලගෝල නාට්‍යයට සංගීත අධ්‍යක්ෂණය කරන ලද්දේ,

(1) චාල්ස් සිල්වා ගුණසිංහ (2) පුණ්‍යසේන ගුණසිංහ

(3) රෝහණ වීරසිංහ (4) රිචඩ් මානමුදලි

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් 28 - 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



(ක) (ග) (ජ) (ට) (ඩ)

28. ''විකෘති'' නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන්නේ,

(1) 'ග' ය (2) 'ජ' ය (3) 'ක' ය (4) 'ට' ය

29. ''වෙසක් දැක්ම'' වීදි නාට්‍යය නිර්මාණය කළ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන්නේ,

(1) 'ට' ය (2) 'ග' ය (3) 'ක' ය (4) 'ඩ' ය

30. ''සිංහබාහු'' නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන්නේ,

(1) 'ක' ය (2) 'ජ' ය (3) 'ග' ය (4) 'ට' ය

31. ''ජනේලය'' නාට්‍යය නිර්මාණය කළ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන්නේ,

(1) 'ට' ය (2) 'ඩ' ය (3) 'ජ' ය (4) 'ග' ය

32. ''අහසින් වැටුණු මිනිස්සු'' නාට්‍යය නිර්මාණය කළ ශිල්පියා / ශිල්පිනිය දැක්වෙන්නේ,

(1) 'ක' ය (2) 'ඩ' ය (3) 'ග' ය (4) 'ජ' ය

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 33 - 37 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| A | මහා සම්මත රජු | E | රිද්දි බිසව | I | මංගර දෙවි |
| B | පඬුවස්දෙව් රජු | F | සේරමාන් රජු | J | දීපංකර බුදුන් |
| C | සංඛපාල රජු | G | රාහු අසුරේන්ද්‍ර | | |
| D | විෂ්ණු | H | සූනියම් යක්ෂණිය | | |

33. සන්නි යකුමේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

(1) A සහ G ය (2) C සහ H ය (3) F සහ J ය (4) E සහ I ය

34. සූනියම් යාගයේ උපත් කතාව හා සම්බන්ධව අදාල වන්නේ,

(1) A සහ D ය (2) B සහ H ය (3) H සහ I ය (4) C සහ E ය

35. කොහොඹා කංකාරියේ උපත් කතාව හා සම්බන්ධ අදාල වන්නේ,

(1) E සහ F ය (2) C සහ J ය (3) D සහ C ය (4) B සහ G ය

36. මඩු ශාන්තිකර්මවල උපත් කතාව හා සම්බන්ධව අදාල වන්නේ,

(1) C සහ G ය (2) E සහ H ය (3) F සහ I ය (4) B සහ A ය

37. රට යකුමේ උපත් කතාව හා සම්බන්ධව අදාල වන්නේ,

(1) F සහ I ය (2) E සහ J ය (3) H සහ J ය (4) C සහ I ය

38. සොකරි රංග ශෛලිය හා සම්බන්ධ නොවන්නේ,

(1) සරල වෙස් මුහුණු භාවිතය

(2) පිරිමින් පමණක් රංගනයේ යෙදීම.

(3) අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් ඉදිරිපත් කිරීම

(4) රත්නපුර ආදී ප්‍රදේශවල ප්‍රචලිත වී ඇත.

39. ආලෝක පහනක් නොවන්නේ,

(1) අල්ට්‍රා වයලට් ලාම්පු (2) වර්ණ චක්‍රය

(3) ධාරාලෝක පහන (4) යොමු පහන

40. දේශීය අභිරූපණ ශිල්පීන් වන්නේ,

(1) සාලමන් ෆොන්සේකා, ලෙස්ටර් ජේම්ස් පීරිස් (2) ශ්‍රියන්ත මෙන්ඩිස්, සැනට් දික්කුඹුර

(3) විමල් කුමාර ද කොස්තා, ඩග්ලස් රණසිංහ (4) මහේන්ද්‍ර පෙරේරා, ජයන්තා රණවක

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය **නාට්‍ය හා රංගකලාව - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දික්තල කාලගෝල නාට්‍යයේ මුල් නිර්මාණ කරුවාගේ වෙනත් නාට්‍ය 2ක් ලියන්න. (ල. 02)

(ii) මෙම නාට්‍ය මුල්වරට වේදිකා ගත කළ වර්ෂය හා රඟහල නම් කරන්න. (ල. 02)

(iii) කාලගෝල චරිතය නිරූපනය කල රූපන ශිල්පියෙකු නම් කරන්න. (ල. 02)

(iv) මෙම නාට්‍යයේ දක්නට ලැබෙන නාඩගම් ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(v) මෙම නාට්‍යයේ ඇඳුම් නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද? (ල. 02)

(vi) ''මගෙ කොමල ලියා // තී මාගේ තමා දේ සතුටා'' මෙම ගීතය ගායනා කරන පාත්‍රයා නම් කරන්න. (ල. 02)

(02) (i) පහත රට ගර්භ සංරක්ෂණ ශාන්තිකර්මයක් නම් කරන්න. (ල. 02)

(ii) එහි අන්තර් රංග අවස්ථා දෙකක් නම් කරන්න. (ල. 04)

(iii) ඉහත (ii) හි නම් කළ එක් අන්තර් රංග අවස්ථාවක නාට්‍ය ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 06)

(03) (i) රංගාලෝකය යනු කුමක් ද? (ල. 02)

(ii) රංගාලෝක උපකරණ තුනක් නම් කර එහි කාර්යය පැහැදිලි කරන්න. (ල. 04)

(iii) රංගාලෝකයේ ප්‍රයෝජන විස්තර කරන්න. (ල. 06)

(04) (i) ප්‍රාසාංගික කලා යනු කුමක්ද පැහැදිලි කරන්න. (ල. 02)

(ii) ප්‍රාසාංගික කලාවේ පොදු ලක්ෂණ හතර ලියන්න. (ල. 04)

(iii) ප්‍රාසාංගික කලා අතර නාට්‍ය කලාවේ සුවිශේෂී බව සාකච්ඡා කරන්න. (ල. 06)

(05) (i) නාඩගම් පැවතුණු ප්‍රදේශ තුන නම් කරන්න. (ල. 02)

(ii) නාඩගම් ප්‍රභවය සම්බන්ධ මතවාද හතරක් ලියන්න. (ල. 04)

(iii) නාඩගමේ විශේෂ ලක්ෂණ විස්තර කරන්න. (ල. 06)

(06) (i) දයානන්ද ගුණවර්ධනගේ නාට්‍ය නිර්මාණ තුනක් නම් කරන්න. (ල. 02)

(ii) ඔහුගේ නාට්‍යයන්හි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ මොනවාද? (ල. 04)

(iii) දයානන්ද ගුණවර්ධනයන් දේශීය නාට්‍ය කලාවට කළ සේවය ඇගයීමට ලක් කරන්න. (ල. 06)

(07) පහත සඳහන් කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍ය පෙළක් රචනා කරන්න.

''පාසලේ 11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අසංක ඉගෙනීමට දුර්වල ශිෂ්‍යයෙකි. ගුරුවරුන්ගේ අප්‍රසාදයට ලක්ව සිටින ඔහු ලෝක ගුරු දිනය දවසේ පාන්දරින් පාසල් පැමිණ සිය බෑගය විවර කර සැරින් සැරේ බලමින් උනන්දුවෙන් සිටියි. යහළුවෙක් මෙය දැක ......?

(i) චරිත සංවාද, රංග විධාන සහිත පෙළ රචනයට (ල. 04)

(ii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ල. 04)

(iii) ගැටුමක් ඇතිවන ආකාරයට අවස්ථා ගොඩ නැගීම. (ල. 04)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**අවසාන වාර පරීක්ෂණය 2022**

11 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

## ප්‍රායෝගික පරීක්ෂණය

**ඇගයීම් 01**

පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)

(i) ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ පුහුණු වී පැමිණෙන විකෘති හෝ දික්තල කාලගෝල යන නාට්‍ය දෙකකින් එකක කොටසක්

(ii) පරීක්ෂක මණ්ඩලය විසින් තෝරා දෙනු ලබන මනමේ හෝ තලමල පිපිලා යන නාට්‍ය දෙකකින් එකක කොටසක් විය යුතුය. (ලකුණු 20)

**ඇගයීම් 02**

ක්ෂණික නිරූපණය (කේවල)

ගුරු භවතා විසින් ලබාදෙන මාතෘකාවට අනුව ක්ෂණික නිරූපණ ඉදිරිපත් කිරීම. (ලකුණු 15)

**ඇගයීම් 03**

කෙටි නාට්‍ය නිෂ්පාදනය - සාමූහික (ලකුණු 20)

**ඇගයීම් 04**

නාට්‍ය ගීතය (කේවල)

අපේක්ෂකයා අභිමත ඕනෑම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් සිදු කිරීම. (ලකුණු 15)

**ඇගයීම් 05**

නිර්මාණාත්මක රංග රචනය (සාමූහික)

සංගීත හඬපටයට අනුව වාචික අභිනයෙන් තොරව ඉදිරිපත් කිරීමකි. (ලකුණු 15)

(අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත සංගීත ඛණ්ඩ භාවිතා කරන්න.)

**ඇගයීම් 06**

කථා පුවතක් නාට්‍ය අනුසාරිව ඉදිරිපත් කිරීම (ලකුණු 15)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(1) | 3 -(4) | 4 -(3) | 5 -(4) | 6 -(1) | 7 -(3) | 8 -(1) | 9 -(3) | 10 -(4) |
| 11-(2) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(4) | 16 -(1) | 17 -(3) | 18 -(1) | 19 -(2) | 20 -(3) |
| 21-(4) | 22 -(1) | 23 -(1) | 24 -(3) | 25 -(4) | 26 -(1) | 27 -(2) | 28 -(3) | 29 -(1) | 30 -(2) |
| 31-(4) | 32 -(2) | 33 -(2) | 34 -(1) | 35 -(4) | 36 -(3) | 37 -(2) | 38 -(4) | 39 -(2) | 40 -(4) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) කාලිංග, සිරිමල් එතනා, හරිස්චන්ද්‍ර, සාලිය අසෝකමාලා, විදුර, රාමායණය, සිංහවල්ලි, සපුමල්, නොහොත් සුළඹාවති. සූර සරදියෙල් සම්බුලා සහ සංඛපාල.

(ii) 1975 ජනවාරි 26, ලුම්බිණි රඟහල

(iii) රිචඩ් මානමුදලි, උදේනි චන්ද්‍රසිරි, සමන් ගුණසිංහ

(iv)
- පොතේ ගුරු චරිතයක් තිබීම
- පූර්ව රංගනයක් තිබීම
- බහුභූත කෝළමා චරිතයක් තිබීම
- පොතේ ගුරු විසින් චරිත හඳුන්වා දීම,
- මංගලම් ගීතයෙන් නාට්‍ය අවසන් වීම.

(v) එස්.එච්. සරත්, ජිනිතා රණසීලි රණසිංහ.

(vi) දික්පිටියා (ලකුණු 2x6 = 12)

02 (i) රටයකුම / රිද්දි යාගය

(ii)
- දොළහ පෙළපාලිය
- නානුමුරය
- කපුයක්කාරිය
- දරුනැළවිල්ල

(ලකුණු 04)

(iii) අනුකරණය / සමාරෝපය / සංවාද භාවිතය / සජීවී බව/ අනුෂාංගික කලා භාවිතය ආදී වශයෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

03 (i) රංග භූමියක් මත සිදු කෙරෙන නාට්‍යයක් සඳහා යොදා ගනු ලබන ආලෝකකරණය, රංගාලෝකය නම් වේ. (ලකුණු 02)

(ii) ධාරා පහන් - වේදිකාව ආලෝකමත් කිරීම
තිත් පහන - පුද්ගලයෙකු / කණ්ඩායමක් හෝ දෙයක් විශේෂ කර දැක්වීම.
වර්ණ චක්‍රය - අවස්ථා තීව්‍ර කිරීම / වර්ණවත් කිරීම
ඩිමර් යන්ත්‍රය - ආලෝක පාලන උපකරණයකි.
ස්මෝක් මැෂිම - දුම් ගැසීම
ආලෝක බුබුළු වැල - පසුපස තිරය ආලෝකමත් කිරීම
හඹායන තිත් පහන - පසුපස හඹායන ආලෝකය (ලකුණු 04)

(iii)
- වේදිකාවේ අඳුර පලවා හැරීම
- අවස්ථා තීව්‍ර කිරීම
- ජවනිකා වෙන් කිරීම
- චරිත තීව්‍ර කිරීම
- වේදිකාවේ හිස් බව දුරු කිරීම
- කාලය හා පරිසරය මැවීම

(ලකුණු 06)

04 (i) ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන ශිල්පියාගේ, පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් රංග භූමියක් මත සජීවීව සිදු කරන නිරූපණ කලාවයි.

(ii) සජීවී බව, ඍජු ප්‍රේක්ෂක සහභාගිත්වය, අභිනය භාවිතය, නිශ්චිත කාල සීමාවක් තිබීම.... ආදී වශයෙන් කරුණු 4ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(iii) නාට්‍ය පෙළක් තිබීම, සජීවී බව , අනුශාංගික කලා භාවිතය, ඍජු ප්‍රේක්ෂක සහභාගිත්වය හා ප්‍රතිචාර, සතර අභිනය භාවිතය ආදී වශයෙන් ලියා විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.(ලකුණු 06)

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

05 (i) යාපනය, හලාවත, කොළඹ, වැලිගම, මාතර තංගල්ල (ලකුණු 02)

(ii) දකුණු ඉන්දීය තෙරුක්කුත්තු වීදි නාටක වලින් ප්‍රභවය ලැබීම / යුරෝපීය ජන වන්දනාවල අභ්‍යාස ලැබීම /දකුණු ඉන්දීය ගැමි නාටකවලින් අභ්‍යාස ලැබීම. / දේශීය කවි නාටක ආභාෂය තුළින් (ලකුණු 04)

(iii)
- නිශ්චිත පෙළක් තිබීම.
- පොතේ ගුරු හා ගායක පිරිසක් සිටීම.
- පූර්ව රංගයක් සහ ස්ථාවරපාත්‍රයන් සිටීම.
- නිශ්චිත ආකෘතියක් තිබීම.
- පිරිමි පමණක් රංගනයේ යෙදීම.
- නාට්‍යධර්මී ශෛලිය භාවිත කිරීම. (ලකුණු 06)

06 (i) නරිබෑණා, ආනන්ද ජවනිකා, මධුර ජවනිකා, බක්මහ අකුණු, ගජමන් පුවත, ඇමති පට්ටම, පරාසයා .... ආදී වශයෙන් නාට්‍ය 3 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 02)

(ii)
- දේශීය ගැමි නාටක හා ජන වහරේ අභාසය ලබා ගැනීම.
- වාර්තා රංග ලෙස හැඳින්විය හැකි නව ආකෘතියකින් වේදිකාව ප්‍රතිනිර්මාණය කිරීම.
- අර්ධ ශෛලිගත නාට්‍ය නිර්මාණය.
- වේදිකා තාක්ෂණයේ නව අත්හදා බැලීම් සිදු කිරීම.
- පර්යේෂණ නාට්‍ය බිහි කිරීම. (ලකුණු 04)

(iii) ඔහුගේ සේවය පිළිබඳ ඇගයීමට ලක්කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

07 නාට්‍යෝචිත ලෙස පිටපත ලියා ඇත්නම් ගුරුවරයාට අභිමත පරිදි ලකුණු ලබා දෙන්න.